## 2019 මාර්තු මස සංඝ පවුල් දින සුපුවත

## 2019 චතාරික සමයට පෙර වදනක්

චතාරික කාලයේ ක්‍රිස්තුන් වහන්සේගේ පාළුකරයේ ජීවිතය අපට අමතක කළ නොහැකි ය. ශුද්ධාත්මයාණන් වහන්සේයි ක්‍රිස්තුන් වහන්සේව පාළුකරයට රැගෙන ගියේ. පාළුකරයේදී දින 40 පුරා (දින 40 යනු සංකේත භාෂාවෙන් දීර්ඝ කාලයකි) ක්‍රිස්තුන් වහන්සේගේ ගුරුවරයාණන් වූයේ ශුද්ධාත්මයාණන් වහන්සේයි. ජොර්දාන නදියේ ස්නාපනය සමඟ ජේසු සමිඳාණන් අත්දැක්කාවූ සර්ව බලධාරි දෙවියන් වහන්සේ මගේ අබ්බා - තාත්තා, අබ්බා - අම්මා බව ස්ථිරව තහවුරු කර ගැනීමට පාළුකර අත්දැකීම පුරාම ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේට මඟපෙන්වූවා නොඅනුමානයි.

තව පැත්තකින් පාපයේ විපාකය වන බඩගින්න පාපයේ විපාකය වන තනි භාවය, පාපයේ විපාකය වන ආදරය නැතිකම මේ ආකාරයෙන් පාපයේ හැම විපාකයක්ම අයුක්තිය, අසාධාරණකම්, එපා කරනු ලැබීම්, තනි භාවයන් මේ හැම එකකටම ජේසුස් වහන්සේ කැමැත්තෙන් මුහුණ දී එය අත්දකිනවා. ශුද්ධාත්මයාණෝ පාළුකරයට ගෙන ගොස් මනුෂ්‍යයාගේ ගැඹුරුම වේදනාවලට, මනුෂ්‍ය ප්‍රශ්නවලට විශේෂාකාරයෙන් ඔවුන් වහන්සේව ඇතුල් කරමින් අත්දකින්නට සලස්වනවා. ඒ ප්‍රශ්න මධ්‍යයේදීත් ගැඹුරු ඇතුලාන්ත ස්වාධීනත්වයක් , සාමාන්‍ය මනුෂ්‍යයෙකුව වහල් කරන, ප්‍රශ්න මධ්‍යයේදීත් සමිඳාණන් තුළ අභ්‍යන්තර නිදහසක් ඔවුන් වහන්සේ අත්දකිනවා. සර්වබලධාරි පරම තැනැන් වහන්සේ මගේ අබ්බා - තාත්තා අබ්බා අම්මා; මා තුළ මහෝත්තමවූ දෙවියන් වහන්සේ අළුත් දෙයක් ඉටු කරන බව. යක්ෂයාගේ පරික්ෂාවලට දුන් පිළිතුරු වලින් මොන නිදහසක් අභ්‍යන්තරයෙන් ඔවුන් වහන්සේ අත්දකින්නට පටන් අරන් තිබෙනවාද යන්න අපට දැකගත හැක.

පාළුකරයෙන් නික්මවිත් ජේසු සමිඳාණන් හැසිරුනු ආකාරය දෙස බලත්දී එතැන් පටන් එතුමන් බැලුවේ සුරැකි පියා වන ජුසේ තුමා දෙසවත්, තම මෑණියන් වූ දේව අම්මා දෙසවත් නොව අබ්බා පියාණන් මෑණියන් දෙස ය. ඔවුන් වහන්සේ දෙව් මෑණියන් / පියාණන්ගෙන් කොපමණ පිරී සිටියද ක්‍රිස්තුන් වහන්සේව මරා දමන්නට එදා ආගමික නායකයින් ගොනු කළ ප්‍රධාන චෝදනාව දේව අපහාස කළා යන්නයි. අපි පුරාණ ගිවිසුම දෙස බලත්දී ජුදා ජාතිකයින් සර්වබලධාරි මැවුම්කාර දෙවි මහෝත්තමයාණන් නමකින් පවා ආමන්ත්‍රණය කළ නොහැකි තරම් ශ්‍රේෂ්ඨ බවයි අත්දුටුවේ. ඔවුන් දෙවිඳාණන් හඳුන්වා දුන් යහවේ යන නාමය ශබ්ද කළ නොහැකි අකුරු හතරකිනුයි භාවිතා කළේ. (Y H W H ) මෙවැනි සුවිශාල බලපෑමක් සහිත පසුබිමක දෙවියන් වහන්සේට ක්‍රිස්තුන් වහන්සේ අබ්බා යැයි කීම විශේෂයෙන් ජුදා ආගමික නායකයන්ට ක්‍රිස්තුන් වහන්සේව මරා දැමීමට තරම් හේතුවක් වූවා.

චතාරික කාලය යනු පාස්කු අභිරහස ජයෝත්සවයෙන් සැමරීමට සූදානම් වීමේ කාලයයි. එනම් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය යි. ජේසුස් ක්‍රිස්තුන් නැමැති මේ මනුෂ්‍යා තුළින් දෙවියන් වහන්සේ ලෝකයේ අළුත්ම අළුත් දෙයක් කළ සේක. මුළු මිනිස් සංහතියට දේව දරුකම හිමි විය. මේ බලසම්පන්න දෙවියන් වහන්සේව අබ්බා යනුවෙන් අත්දැකීමට අපට වාසනාව ලැබුණේ එතුමාණන්ගේ කුරුස පත්වීමේ දිව්‍ය පූජාවෙනි. ඔවුන් වහන්සේ අපට දිනා දුන් දේව පුත්‍රභාවය අපගේ ජීවිත තුළ අත්දැකීම ගැන අප කොතෙක් අවදියෙන් ද, ස්තුති පූර්වකව මේ මහඟු උරුමය අත්දකිනවාද යනුවෙන් හැරී බලන්නට මේ දින 40 අපට භාග්‍යවන්ත කාලයකි.

ක්‍රිස්තුන් වහන්සේ සැබෑ මනුෂ්‍යයෙකු බව අප කිසි විටෙක අමතක නොකළ යුතු ය. ඔවුන් වහන්සේ දේව පුත්‍රයා වූ සේ ම, ලේ ඇට මසින් මිනිස් සීමාවන් සහිත මනුෂ්‍ය පුත්‍රයෙකි. දුක වේදනාව, නිදිමත, වෙහෙස, බඩගින්න දැණුනු මිනිසෙකි. යක්ෂයා ඔවුන් වහ්නසේව පරික්ෂා කර දේව පුත්‍රභාවය උදුරා දමා මිනිස් සංහතියට හිමිවන්නට යන ගැළවීම නැති කිරීමට උපා සෙවීය. යක්ෂයා, ලෝකය, මාංශයා ත්‍රිවිධ සතුරන් ක්‍රිස්තුන් වහන්සේව පරික්ෂා කරන අතර, ඔවුන් වහන්සේ ශුද්ධාත්ම ගුරුවරයාණන්ට නතු වී සැබෑ මනුෂ්‍ය පුතෙකු ලෙස ප්‍රතිචාර දක්වන අන්දම දෙස බැලීම ඉතා වටනේ ය. බල තණ්හාවට - ධනයට කෑදරවීමට, මානයෙන් උඩඟු වීමට තිබූ පරික්ෂාවන් පරාජය කිරීමට යාච්ඤා ජීවිතය, දේව වචනය, ශුද්ධාත්මයාණන්ට අවදිවීමේ ජීවිතය අවියක් කරගන්නා ආකාරය ක්‍රිස්තුන් වහන්සේ දෙස බලමින් අප භාවනා කළ යුතු ය. මේ සියළු බාධක පරික්ෂා මධ්‍යයේ ඔවුන් වහන්සේ දෙව් පියාණන් දෙව් මෑණියන්ගේ ප්‍රිය ප්‍රසන්න පුත්‍රයාණන් බව සාක්ෂි දරණවා. සත්‍ය වශයෙන්ම සුවිශේෂක ගත්කරුවන් ක්‍රිස්තුන් වහන්සේ මුහුණ දුන් පරික්ෂාවන් පාළුකරයේ දින 40 තුළින් මතු කළද, ඔවුන් වහන්සේගේ ජීවිත කාලය පුරාම මේ හරහා ඔවුන් වහන්සේ ගමන් කළ සේක. ඒ සෑම අවස්ථාවකදීම මේ සියල්ල ජයගත් බව අපට දැකගත හැක. කුරුස ගසේදී පවා ඒ අවට සිටියවුන් ඔවුන් වහන්සේට අභියෝග කළේ , උසුළු විසුළු කළේ ඔබ

දේව පුත්‍රයා නම් ඔබ කුරුසයෙන් ගැළවෙන්න කියා සරදම් කරමිනි. ක්‍රිස්තුන් වහන්සේට එසේ කිරීමට වුවද බලය තිබුණා ද, ඔවුන් වහන්සේට කීකරු වීමට අවශ්‍ය වූයේ දෙවි පියාණන් වහන්සේට පමණෙකි. දෙවි මහෝත්තමයාණන්ට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කොපමණ වශී වී සිටියා ද, කුරුසයේ එල්ලී අවසාන මොහොත දක්වා ම අබ්බා පියාණන්ට පක්ෂපාතී වූ සේක.

එසේ නම් මේ චතාරික සමයේ දෙවි මහෝත්තමයාණන්ට අප ද අබ්බා තාත්තේ අබ්බා අම්මේ කියා ආමන්ත්‍රණය කිරීමට ඔවුන් වහන්සේගේ පුත්‍රභාවයට ගැඹුරින් නතුවිය යුතු වෙමු. පුත්‍රයා නම් ඔවුන් වහන්සේට වචනයට ගැඹුරින් අවනත විය යුතු ය. පක්ෂපාතී විය යුතු ය. අපගේ ස්වාමියාණන් වන දේව පුත්‍ර ජේසු ක්‍රිස්තුන් වහන්සේ සමඟ එකට බද්ධ වී යක්ෂයාගේ බලය පරාජය කළ යුතු ය. ධනයට, බලයට, මානයට ඇති කෑදරකම, මුල් අගුණ පව්, ඇතුලාන්ත තුවාල, ඝනයේ අධික පෙළඹීම් පුරුදු ඇබ්බැහිවීම් වලින් ජය ගැනීමට පාපයේ බරපතලකම අවබෝධ කර ගැනීමත් ජේසු සමිඳාණන්ගේ ගැළවීමේ බලයට විවෘත වීමක් සිදුවිය යුතු ය.

"ප්‍රේමවන්තයිනි, චතාරික කාලයේදී අපව විශේෂයෙන් ශුද්ධවූ සභාව කැඳවනවා පරණ දේ අතහැර දමා ක්‍රිස්තුන් වහන්සේ තුළ අළුත් ජීවිතයකට ඇතුල් වීමට. එය අපි කොච්චර අධිෂ්ඨාන කළත්, කොච්චර තීරණ ගත්තත් අපට පෙනෙයි, අපට එය කරන්න බැරි බව. සමහර විට තීරණ පිට තීරණ අපි ගන්නවා. ඒත් අපිට ජේනවා අපි වැටෙන හැටි. ඒ නිසා එක දෙයක් අපට පෙනෙයි අන්තිමේදී අපව නිදහස් කිරීම, අපට බලයක් අත්දැකීමට සැලැස්වීම, පූර්ණ ජීවිතයක් ගත කිරීම දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන තෑග්ගක් කියලා. ඒ තෑග්ග අපට ලැබෙනවා.
එහෙත් ඒ තෑග්ග අපට සම්පූර්ණයෙන් ලැබෙන්නේ,

i අපේ ආශාව
ii අපේ තිබෙන්නාවූ සහයෝගය
iii ශු.පාවුළු තුමා මෙන් ක්‍රිස්තුන් වහන්සේව අයිති කර ගැනීමට අපගේ තිබෙන්නාවූ මේ මහත් ලොකු අභිලාෂය - කැමැත්ත උඩයි."

(1989 චතාරිකයේ සඳුදා පණිවුඩය - ස්වාමි තාත්තා)

**"මාගේ කැමැත්ත නම් ක්‍රිස්තුන් වහන්සේව අත්කර ගැනීමත්, ඔවුන් වහන්සේ හා ඒකාබද්ධ වීමත් ය."**

ඉතින් ඒ ආකාරයෙන් අපි කරන්න යෙදුනොත් අපිටත් එදා ජෝර්දාන් නදියේ ජේසු සමිඳාණන්ට පියාණන් වහන්සේ වදාළ' ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාය මම ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි' හඬ ඇසීමේ භාග්‍ය අත්දැකිය හැකිවේවි.

මේ චතාරික සමය තුළ මේ උතුම් භාග්‍ය මුළු මහත් පුබුදු ජනතාවටම අත්දැකීමේ වරප්‍රසාද පතා අපි යාච්ඤා කරමු.

(හතර දෙනාගේ පුංචි සංඝයන් තුළ සාකච්ඡා කරන්න)

* අද දවසේ අපට ලැබුණු සුභාරංචිය තුළ පාළුකරයෙහි දින 40 පුරා ජේසු සමිඳාණන් වහන්සේ අත්දුටු අත්දැකීමට ඇතුළු වන්නට මගපෙන්වන ලදී.

* පාළුකරයේ දින 40ක කාලය තුළ සමිඳාණන් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙස අත්දුටු අත්දැකීම වූයේ (ගැඹුරුම තනිභාවය, අසරණකම, හුදෙකලාව, කුසගින්න) තුළ දෙවියන් වහන්සේ අබ්බා ලෙසත් දෙවියන් වහන්සේ අම්මා ලෙසත් අත්දැකීමයි. ඔබත් / මමත් ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ දේව පුත්‍රභාවයට කැඳවුම ලැබුවේ ක්‍රිස්තුන් වහන්සේ අනුගාමී වන්නට ය. අපේ ජීවිත තුළ අප පසු කරන පාළුකරයන් තුළ දෙවියන් වහන්සේ අප සමඟ වැඩ සිටින බවත්, ඔවුන් වහන්සේ අපේ අබ්බා බවත් අම්මා බවත් අත්දකිනවා ද?

* පාළුකර අත්දැකීම තුළ නිරන්තරයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේට තමන් වහන්සේව මෙහෙයවන්නට ඉඩදුන් සමිඳාණන් වහන්සේ ගැඹුරු නිශ්චලතාවය තුළ පූර්ණව පියාණන් වහන්සේගෙන් යැපුනාහ. පියාණන් වහන්සේ හා ගැඹුරු සම්බන්ධකමක් පවත්වමින් පියාණන් වහන්සේ සිදු කරන්නට යන අළුත් දෙය දෙස ආලෝකයෙන් බලා සිටියහ. අපේ ජීවිතවල අප පසු කරන විවිධ වූ තනිභාවයන්, හුදෙකලාවන්, වේදනාවන් තුළ පියාණන් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් ඔවුන් වහන්සේගෙන් යැපෙන්නට ශුද්ධාත්මයාණන් වහන්සේට අප තුළ ක්‍රියා කරන්නට අප ඉඩ දෙනවා ද?

* දේව පුත්‍රභාවය අත්දැකීමට අභියෝගයන් එල්ලවන හැම මොහොතකම ක්‍රිස්තුන් වහන්සේ මෙන් දෙවියන් වහන්සේගේ පුතෙකු ලෙස සාක්ෂි දරන්නට, පුත්‍රභාවයේ අභිමානයෙන් යුතුව පිළිතුරු දෙන්නට අප තුළ ඇති අවදි වීම කොතෙක් ද?

**ප්‍රායෝගිකව :**

* ඝෝෂාව, කලබලය, නොසන්සුන්තාවය, වැනි තත්ත්වයන් තුළ වුව ද ගැඹුරු නිශ්චලතාවයකට ගමන් කරන්නට පියවර ගනිමු.

* උපවාසයෙන් යුතුව ගැඹුරු මනස්ස්ථාපනයකට ඇතුළු වෙමු.

* ගැඹුරු යාච්ඤාවේ ජීවිතයක් තුළින් දෙවිඳුන් වෙතට ළඟා වෙමු.
  උදා: මගේ පැය (පෞද්ගලික යාච්ඤාව)ට වැඩි කාලයක් දෙමු.
  නිරන්තර අවදිවීමට ඇතුළු වෙමු.

* හැකි සෑම මොහොතකම දිව්‍ය සත්ප්‍රසාද සමිඳුන් අභියස පෙනී සිටිමු.

* හැකි සෑම දවසකම දිව්‍ය පූජාවට සහභාගි වෙමු.

**************************

අවධානය සඳහා :

* 2019 මාර්තු මස 03 වන දින සිට අප්‍රියෙල් මස 22 වෙනිදා දක්වා ප්‍රශංසා එකතු සුපුවත සඳහාද චතාරික භාවනා පොතෙහි දිනට නියමිත භාවනාව යොදා ගන්න.